# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 245 — 1976 දෙසැම්බර් 24 වැනි සිකුරාදා — 1976.12.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II වැනි කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පනත් | අතිරේකයන් | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම | — |
| පනත් කෙටුම්පත් | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම | 1/51 |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම | — | බූදල් නඩු පිළිබඳ දැන්වීම | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — | නොතාරිස් ලැයිස්තුව | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම... | — | විවිධ දැන්වීම | |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම | — | | |


සැ.යු.—ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය (සංස්ථාගත කිරීමට) පනත් කෙටුම්පත සහ මුදල් සංශෝධන පනත් කෙටුම්පත 1976 දෙසැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## බස්නාහිර පලාත

### පිස්කල් විකිණීම

අංකය : 18261/ඉ.

වත්තිආරච්චිගේ කුරුණාවතී පෙරේරා අංක 230, මැක්වත්ත, අස්ගිරිය, ගම්පහ "ඇනට් පෙරේරා නිවස" ගලහිටියාවේ ගනේමුල්ල .............................................. පැමිණිලිකාරිය.

එදිරිව

කෝන්ගොඩ සිටුගේ දයානන්ද "නිරෝෂා" මොරන්න, යක්කල .............................................. විත්තිකරු.

මෙහි පහත සඳහන් දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1977 ක්වූ ජනවාරි මස 27 දින පෙරවරු 10ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම විකිණීම කරනු ලබන්නේ වර්ෂ 1975. 2. 27 වැනි දින සිට 27.8.1976 වන තෙක් රු. 8,000 සහ එයට එකතු වන 5% පොලිය වන රු. 600 සහ 1976 8. 27 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිදහස්වන දිනය තෙක් රු. 8,000 ට 5% බැගින් එකතු වන නිත්‍යානුකූල පොලියද, සියළුම පිස්කල් ගාස්තුද, වර්ෂ 1976 ක්වූ ජූලි මස 1 වන දින ගම්පහ දිසා අධිකරණයෙන් ඉහත සඳහන් නඩුවේ තීන්දුව අනුව අයකර ගැනීමට වේ.

ඉහත සඳහන් දේපල විස්තරය

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දැනට ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අලුත්කුරු කෝරලේ දාසිය පත්තුවේ අස්ගිරියේ පිහිටි විහාර කන්ද එස්ටේට් නමැති ඉඩමේ අංක 9 දරණ කොටස එල්. මැක් බලය ලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද වර්ෂ 1955 ක්වූ ඔක්තෝම්බර් මස 10 වන දින අංක 538 දරණ සැලැස්මේ ප්‍රකාර මායිම් උතුරට අංක 37 බී දරණ පාරක් සඳහා ඉතිරි කළ බිමද, නැගෙනහිරට : අංක 10 දරණ පාරක් සඳහා ඉතිරි කළ බිමද ; දකුණට : ඩී. ජී. ජෝන් ක්ලාස් තෝනාගේ ඉඩමද ; බස්නාහිරට : අංක 8 දරණ කොටසද, මෙහි තුළ රූඩ් එකකුත් පර්චස් දෙකක් (රූ. 1, ප. 2) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ළිඳ සෙවිලි කළ මගය ඇතුළු ගසකොළ, පලතුරු ආදී සියළු දේද.

2. එකී අස්ගිරියේ පිහිටි විහාර කන්ද එස්ටේට් නමැති ඉහත සඳහන් ඉඩමට සෑදූ එකී අංක 538 දරණ සැලැස්මේ අංක 37 බී දරණ පාර සඳහා වෙන්කළ කොටසට එකී සැලැස්මේ ප්‍රකාර මායිම් උතුරට : අංක 17, 16, 15 සහ 14 දරණ කොටස්ද ; නැගෙනහිරට : අංක 37 සී දරණ කොටසද ; දකුණට : අංක 9, 8, 7, 6 සහ 5 දරණ කොටස්ද ; බස්නාහිරට : අංක 37 ඒ දරණ කොටසද ; මෙහි තුළ පර්චස් විසිඅටයි දශම එකක් (අ. 0, රූ. 0, ප. 28.1) ක් විශාල ඉඩම් කොටස පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිවාසිකමද, යන දේපල වේ.

ඩී. ලියනගේ,
ගම්පහ, දිසා අධිකරණයේ පිස්කල්.

වර්ෂ 1976 ක්වූ දෙසැම්බර් මස 10 දින,
ගම්පහ දිසා අධිකරණයේදීය.

12-496—76.12.24 දින අංක 245 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1976 පෙබරවාරි 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1/51 – බී 72224—5,075 (76/11)